රේදිපිළි පංගු මණ්ඩලය 2010

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව, රේදිපිළි පංගු මණ්ඩලය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනටරේදිපිළි පංගු මණ්ඩලයේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.2.1 <u>ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති</u>

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 ට අනුකූල වන පරිදි සේවක පාරිතෝෂික ගෙවීම සඳහා ප්‍රතිපාදන කර ඇති රු. 1,683,200 ක මුදල ආයෝජනය කිරීම පිළිබඳ තොරතුරු වෙනම මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

1.2.2 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

<u>ගිණුම්වල අඩුවෙන් දැක්වීම්</u>

ලැබිය යුතු ගිණුම් යටතේ රු. 257,955 ක ලැබිය යුතු පොලී ආදායම් අඩුවෙන් දක්වා තිබුණි.

1.2.3 <u>නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණයන්ට අනුකූල නොවීම</u>

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2003 ජුනි 02 දින හා අංක පී.ඊ.ඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| | (i) 5.1.1 හා 5.1.2 ඡේදය | සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබූ අතර ක්‍රියාකාරී සැලැස්ම අනුමත කර නොතිබුණි. |
| | (ii) 5.2.4 ඡේදය | අදාල මුදල් වර්ෂය ආරම්භවීමට දින 15 කට පෙර වාර්ෂික අයවැය ලේඛනය පිළියෙළ කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| | (iii) 9.2 ඡේදය | අනුමත සේවක සංඛ්‍යාව, බඳවා ගැනීමේ පරිපාටිය හා සංවිධාන සටහන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබුණි. |
| | (iv) 8.3.9 ඡේදය | සංස්ථා හා මණ්ඩලවල සම්පත් රේඛීය අමාත්‍යාංශය විසින් ප්‍රයෝජනයට නොගැනීමට වග බලා ගන්නා ලෙස දක්වා තිබුණත් ඊට පටහැනිව පේෂකර්ම සංවර්ධන අමාත්‍යවරයාගේ කාර්යාලයේ සේවය කරන නිලධාරීන් වෙනුවෙන් වැටුප් හා දීමනා වශයෙන් 2010 වර්ෂය තුලදී රු. 256,620 ක් ගෙවා තිබූ අතර එය ප්‍රතිපූර්ණය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 2007 අංක 14 දරන එකතු කළ අගය මත සංශෝධිත බදු පනත | වැට් බදු සහිත බිල්පත් පියවීමේදී එම ප්‍රමාණයෙන් 1රු3 ක ප්‍රමාණයක් රඳවා ගෙන පියවීම් කළ යුතු වුවත් රු. 157,897 ක රඳවා ගැනීම් සිදු කර නොතිබුණි. |

## 1.2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගණුදෙනු

(අ) 2010 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ ජංගම වගකීම් යටතේ දක්වා තිබූ රු. 774,079 ක් වූ වර්ෂ 05 ක් ඉක්මවන ලද මුදල් තැන්පතු ද, ගෙවිය යුතු ගිණුම් යටතේ දක්වා තිබූ වර්ෂය ඉක්මවන ලද රු. 303,269 ක් ද ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබූ භාණ්ඩාගාර බිල්පත් ආයෝජන වලින් රු. 2,758,176 ක් හා ජංගම වත්කම් යටතේ දක්වා තිබූ ලැබිය යුතු ගිණුම් වටිනාකමින් වර්ෂය ඉක්මවන ලද රු. 1,279,960 ක් ද එනම් එකතුව රු. 5,115,484 ක් නිසි අනුමැතියකින් තොරව 2009 වර්ෂයේදී ගිණුම්වලින් කපා හැර තිබීම සමාලෝචිත වර්ෂයේදී ද විධිමත් කිරීමට කටයුතු කර නොතිබුණි. අධි වෙන්කිරීම්, වැරදි ගිණුම් සටහන් වැනි හේතුන් මත උද්ගත වූ ශේෂ හෙයින් කපා හැරි බව සභාපති දැනුම් දී ඇත.

(ආ) ක්‍රියාත්මක අධ්‍යක්ෂක මණ්ඩලයක් නොමැති අවස්ථාවකදී රු. 4,038,136 ක් වූ ශේෂ පත්‍ර වත්කම් විෂයයන් 2 ක් හා රු. 1,077,348 ක් වූ බැරකම් විෂයයන් 2 ක් 2009 වර්ෂය අවසානයේදී ගණකාධිකාරී විසින් කපා හැරීම සමාලෝචිත වර්ෂයේදී ද විධිමත් කිරීමට කටයුතු කර නොතිබුණි.මේ සඳහාභාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමින් තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය සමාලෝචනය

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂය තුල මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවලින් රු. 2,286,406 ක අතිරික්තයක් වූ අතර ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 6,470,570 ක් වූයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු. 4,184,164 ක් හෙවත් 65 ක පිරිහීමක් දක්නට ලැබුණි.

#### 2.1.2 මූල්‍ය ප්‍රතිඵල සමාලෝචනය

මූල්‍ය ප්‍රතිඵලයේ ඌනතාවය සඳහා පොලී ආදායම 35 කින් පහල යාම හා නිලධාරීන් බඳවා ගැනීම නිසා පුද්ගල පඩි නඩි 25 කින් ඉහල යාම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.2 මෙහෙයුම් සමාලෝචනය

#### 2.2.1 කාර්ය සාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**සේවා සැපයීම**

| | 2010 | 2009 | වෙනස්වීම % |
|---|---|---|---|
| ලියාපදිංචි ඇඟළුම් කම්හල් ගණන | 1226 | 1141 | 7 |
| දැනට ක්‍රියාත්මක ඇඟළුම් කම්හල් ගණන | 668 | 723 | (7) |
| බඳු ගෙවීමට යටත් ආයතන ගණන | 423 | 309 | 37 |
| අවලංගු වූ ආයතන ගණන | 83 | 70 | 18 |
| වසා දමන ලද ආයතන ගණන | 52 | 39 | 33 |

**2.2.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නව පනතක් සකස් කිරීම සඳහා බාහිර පුද්ගලයෙක් පත්කර රු. 45,000 ක මුදලක් ගෙවීමට ගිවිසගෙන තිබූ අතර, එම මුදලින් 2007 වර්ෂයේදී රු. 22,500 ක් ගෙවා තිබුණි. 2007 මාර්තු මාසය අවසානයේදී අදාල පුද්ගලයා විසින් පනතේ කෙටුම්පත සකස් කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර තිබුණු නමුත් 2011 මාර්තු මාසය වන විටත් එම පනත වලංගු පනතක් බවට පත් කර ගැනීම සඳහා ඉදිරි ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ආ) 1997 සහ 1999 වර්ෂවලදී එකතුව රු. මිලියන 13 ක් භාණ්ඩාගාරයේ අංක 6000/0/0/3/606 දරන පොදු තැන්පත් ගිණුම යටතේ තැන්පත් කර තිබුණි. මෙම තැන්පතු සඳහා පොලී ගෙවීමක් ද සිදු නොකරන බැව් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මණ්ඩලය වෙත දන්වා තිබුණි.

2005 ජුලි 13 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 30 පරිදි භාණ්ඩාගාර බිල්පත්‍ර ඇප තැන්පතු රජයේ සුරැකුම්පත් හෝ වෙනත් ඕනෑම ආයෝජනයක් කුමන ආයතනයක පවත්වා ගෙන ගිය ද එම ආයෝජනයන් මහා භාණ්ඩාගාරයේ භාරකාර අරමුදලට (Trust Fund) මාරු කළ යුතු බව දන්වා තිබුණි. කෙසේ වුවද මෙම චක්‍රලේඛය නිකුත් වී වර්ෂ 05 ක කාල පරිච්ඡේදයක් ගත වී තිබුණ ද මණ්ඩලය විසින් මෙම මුදල් භාරකාර අරමුදලට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි.

**2.2.3 ආර්ථික නොවන ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2007 වර්ෂය තුළදී ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වූ විද්‍යුත් සුපරීක්ෂණ පද්ධතියක් (Electronic Monitoring system) හඳුන්වා දීම සඳහා පෞද්ගලික විගණන සමාගමකට රු. 921,265 ක පිරිවැයකට 2007 අගෝස්තු 20 දින කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණි. එහෙත් 2010 වර්ෂය වන විට එකතුව රු. 582,709 ක් ගෙවා තිබුණ ද අදාල කාර්යය ඉටු වී නොමැති නිසා මේ වෙනුවෙන් වැය කළ මුදල නිශ්කාර්ය වියදමක් ලෙස නිරීක්ෂණය විය.මීට අමතරව 2011 වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලින් රු. 336,070 ක් ද වෙන් කර තිබුණි.

(ආ) මණ්ඩලය පවත්වා ගෙන යන වර්ග අඩි 4124 ක් වූ ගොඩනැගිල්ලේ කාර්යාල කුලිය, විදුලිය හා ජලය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 5,760,958 ක මුදලක් ගෙවා තිබුණි.

සමාලෝචිත වර්ෂයේදී මණ්ඩලයේ සේවයේ නියුතුව සිටි නිලධාරි සංඛ්‍යාව 43 ක් වූ අතර කාර්යාලයේ ඉඩ ප්‍රමාණය හා පිරිවැය ආයතනයේ කටයුතුවලට ප්‍රමාණවත් තරමට වැඩි බැව් නිරීක්ෂණය විය. එක් නිලධාරියෙකු වෙනුවෙන් රු. 11,164 ක මුදලක් කාර්යාල කුලිය වශයෙන් මාසිකව මණ්ඩලය විසින් වැය කර තිබුණි. මණ්ඩලයේ රෙදිපිළි සලාක ක්‍රමය අවසන් වී ඇති අතර, ඇඟළුම් ආයතන වලින් වාර්ෂිකව ලබාගන්නා සේවා ගාස්තුව හා ස්ථාවර තැන්පතු පොලී ආදායමින් ආයතනයේ වියදම් පියවා ගන්නා බැවින් වියදම් අවම කර මූල්‍ය කළමනාකරණ කටයුතු පිළිබඳව නිසි අවධානයක් යොමු කර නොතිබුණි. 2011 පෙබරවාරි මාසය වන විට ආයතනයේ නිලධාරීන් සංඛ්‍යාව 14 ක් වන අතර ඉහත මාසික කුලිය රු. 524,457 ක් වූයෙන් එක් පුද්ගලයෙකු වෙනුවෙන් කාර්යාල කුලිය මසකට රු. 37,461 ක් වී තිබුණි.

(ඈ) රෙදිපිළි පංගු මණ්ඩල සඳහා වෙබ් අඩවියක් 2010 වර්ෂය තුලදී ආරම්භ කිරීමට රු.95,835 ක්ගෙවීමට සිදු වී තිබුණ ද වෙබ් අඩවියක් ආරම්භ කර නොතිබුණි. ආයතනයේ පැවැත්ම අවිනිශ්චිත තත්ත්වයක පැවතීම නිසා මේ සඳහා ගිවිසුම් ප්‍රකාර එකඟ වී ඇති මුදල අනාර්ථික ගණුදෙනුවක් ලෙස නිරීක්ෂණය විය.

### 2.2.4 අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම

සමාලෝචිත වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වා නොතිබූ අතර ඒ අනුව තීරණ ගැනීමේදී එය කිසිදු දායකත්වයක් සපයා නොතිබුණි.

### 2.2.5 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කොට නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදි. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුවිය යුතු ය.

(අ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
(ආ) ණය පියවීම
(ඇ) කාර්යාල කුලී ගෙවීම්
(ඈ) නිලධාරි පත්වීම් සහ උසස්වීම්